**ශ්‍රී ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් පෞද්ගලික සමාගම - 2020**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් පෞද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සමුච්චිත අතිරික්තය රු. 357,000 ක් අඩුවෙන් ප්‍රකාශ කිරීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනයහි සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි එම අගයෙන් වෙනසක් පෙන්නුම් කරන ලදී. | 2019 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට හිමිකම්වල සූත්‍ර දෝෂය හේතුවෙන් හිමිකම් රු.44,821,799 ලෙස නිවැරදි කළ යුතුය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හිමිකම් නිවැරදිව සඳහන්කර තිබේ. ශේෂ පත්‍රයේ වෙනසක් නොමැති බැවින් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය නිවැරදි සංඛ්‍යා වලින් ප්‍රතිස්ථාපනය කිරීමේ අවස්ථාව ලබා දෙන්නේ නම් අගය කරනු ලැබේ. | නිවැරදි මුදල ගණනය කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට ICTA මව් සමාගමෙන් ලැබිය යුතු රුපියල් 44,001,286 ක මුදලක් 2020 වසර අවසානය වනවිට ලැබී නොතිබුණි. | ICTA ආයතනය වෙතින් බාහිර ණය වෙනුවෙන් හිමිකම් පෑම සඳහා LGII ආයතනයට බාහිර ණය තිබිය යුතුය. එවැනි ණයක් නොමැතිව ICTA ආයතනයට LGII ආයතනය වෙත ගෙවීමට ක්‍රමයක් නොමැත. මේවන විට රු. 822,800 ක් හැර LGII ආයතනය විසින් සැපයුම්කරුවන්ට කිසිදු මුදලක් ගෙවිය යුතුව නැති අතර එබැවින් ICTA ආයතනයට මෙම ණය LGII ආයතනය වෙත ගෙවීමට නොහැකියාවක් නැත. අනෙක් අතට, ICTA ආයතනය විසින් ICTA ආයතනය සමඟ LGII ආයතනය | ලැබිය යුතු මුදල අයකරගත යුතුය. |

ඒකාබද්ධ කිරීමට දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කරගෙන තිබෙන අතර ඒ සමඟ මෙම ශේෂයන් හිලව් කෙරෙනු ඇත. (ඒකාබද්ධ කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් දැනටමත් අමාත්‍යාංශයට යවා ඇති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සහ ලිපිය සඳහා ඇමුණුම බලන්න.)

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය. | 2011 ජූලි 18 වැනි දින සමාගම පිහිටුවීමෙන් පසු සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | ICTA ගිණුම් සකස් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් LGII ගිණුම් ද ප්‍රමාද වූ අතර ICTA සහ LGII ඇතුළත් ඒකාබද්ධ ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. LGII හි එකම කොටස් හිමියා ICTA වන අතර, ICTA අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම් දෙකෙහිම ගිණුම් අනුමත කර තිබිණි. වාර්ෂික මහා සභා රැස්වීම නොපැවැත්වීම සමාගම් පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් බව සලකනු ලබන නමුත්, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අතපසුවීම් නිවැරදිකර ගිණුම් යාවත්කාලීන කිරිමෙන් පසු, නිවැරදි ක්‍රියාපටිපාටි අනුගමනය කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සමාගම විසින් 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | LGII හි ක්‍රියාකාරී සැලැස්ම ICTA හි ක්‍රියාකාරී සැලැස්ම යටතේ අන්තර්ගත කර තිබේ. තවද, 2020 වර්ෂයේදී, ICTA සැලැස්ම යටතේ LGII හි කාර්යයන් ඇතුළත් වූ ක්‍රියාකාරී සැලැස්ම මගින් මේවන විට ICTA විසින් සැලසුම් කරන ලද යෝජිත ඉදිරි ඩිජිටල් උපාය මාර්ගයේ ඩිජිටල් සේවා උපාය ස්ථම්භය හරහා LGII හි වැඩ විෂය පථය ආමන්ත්‍රණය කර තිබේ. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12- යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ. | | | |

| | | | |
|---|---|---|---|
| (i) මාර්ගෝපදේශ අංක 6.5.1 | 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය මාස 18ක ප්‍රමාදයකින් පසුව විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර ඒවා සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ බව පිළිගනිමු. 2016 වර්ෂයේ සිට පැවති අතපසුවීම් නිවැරදි කෙරෙමින් පැවතීම එයට හේතු විය. කෙසේ වෙතත්, අප විසින් මේ වනවිට විගණකවරුන් සඳහා 2021 ගිණුම් සහ රජයේ දින දර්ශනයට අනුකූල වන පරිදි සැලසුම සකස් කර තිබේ. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ii) මාර්ගෝපදේශ අංක 9.2 | මානව සම්පත් අයවැය සමඟ ඒකාබද්ධ කර මානව සම්පත් සැලැස්ම සකස් කළ යුතු අතර අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. එසේ වුවද ඒ අනුව පියවර ගෙන නොතිබුණි. | ICTA ආයතනයට මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබා දී තිබූ අතර ස්ථාවර කාලීන කොන්ත්‍රාත්තු (වසර 01) මත කාර්ය මණ්ඩලය බඳවාගෙන ව්‍යාපාරික අවශ්‍යතා මත අලුත් කරන ලද බැවින් මානව සම්පත් සැලැස්ම සහ සේවක සංඛ්‍යාව සකස් කර නොමැත. තවද, ICTA සහ එහි අනුබද්ධිත ආයතනවල මානව සම්පත් මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා 2003-මැයි 27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය (අංක 3/0884/134/027) මගින් ICTA වෙත මෙහෙයුම් ස්වාධීනත්වය ලබා දී තිබේ.<br>2017 දී අමාත්‍ය මණ්ඩලය විසින් ICTA ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලද අතර එය මත පදනම්ව එවකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය කළමනාකාරිත්වය විසින් ආරම්භ කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ආයතනික ව්‍යුහය අනුමත සේවක සංඛ්‍යාව සමඟ යළි සකස්කර තිබේ.<br>2020 නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද නව අමාත්‍ය මණ්ඩල සංදේශය හරහා නව ආයතනික ව්‍යුහය සහ මෙහෙයුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මාර්ගෝපදේශ අංක 9.3.1 | සමාගම විසින් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. | 2019 දී සකස් කරන ලද බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය 2020 වර්ෂය සඳහා අඛණ්ඩව පැවතුනි .(එය දැනටමත් 2020 මූල්‍ය ප්‍රකාශන විගණනයේදී විගණකවරුන් වෙත ලබා දී තිබේ.) | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,480,734 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,316,964 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,836,230 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ප්‍රදාන ලැබීම රු. 5,710,114 කින් අඩු වීම මෙම පිරිහීමට හේතු වී තිබේ.